# 3 අසනීපවූ විට, ගින්නක් ඇතිවූ විට, රිය අනතුරක් ඇතිවූවිට, කුමක් කලයුතුද

ඔබට ශරීරයේ අපහසු තාවයක් ඇතිවී අසනීප වූවිට, කරුණාකර අංක 119 ට දුරකථයෙන් අමතන්න.
ගින්නක් ඇතිවූ විට කරුණාකර අංක 119 ට දුරකථයෙන් අමතන්න.
මහාමාර්ග හදිසි අනතුරක් ඇතිවූ විට අංක 110 ට දුරකථනයෙන් අමතන්න.
මුදල් අයවීමක් නොමැත. කුමන අවස්ථාවක වුනත් දුරකථනයෙන්ඇමතිය හැක.
දුරකථන ඇමතුමකදී  කරුණාකර පහත සදහන් ආකාරයට කථාකරන්න.

## （1） හදිසියේ අසනීප වූ විට සහ තුවාල සිදුවුණු අවස්ථාවකදී

කරුණාකර අංක 「 119 」 ට දුරකථන ඇමතුමක් දෙන්න. <u>ඇම්බියුලන්ස් එක ( *Kyūkyūsha* )</u> ඔබ ළඟට පැමිණේ.දුරකථනයෙන් පැවසීමේදී පහත සඳහන් ආකාරයට සඳහන් කරන්න.

① 「 ශරීරයේ තත්වය හොදමදි 」 ( අසනීපයි・තුවාල වුණා )
② එම අවස්ථාවේදී ඔබ සිටින ස්ථානය?
③ අසනීප වූ පුද්ගලයාගේ වයස,ගැහැණු පිරිමි බව ( පිරිමිහෝ ගැහැණු )
④ කාට කුමක් වුනාද යනවග
⑤ ඔබගේ නම සහ දුරකථන අංකය



## （2） ගින්නක් ඇතිවූ විට

කරුණාකර 「 119 」 දුරකථන අංකයට අමතන්න.එවිට <u>ගිණිනිවන රථය ( *Shōbōsha* )</u> එම ස්ථානයට පැමිණේ.දුරකථනයෙන් අමතන විට කරුණාකර පහත සඳහන් දෑ පවසන්න.

「 ගින්නක් ඇවිළී ඇත 」
① ගින්න ඇවිළී පිළිස්සී තිබෙන ස්ථානය පිළිබඳව
② පිළිස්සී තිබෙන දෑ පිළිබඳව
③ තුවාල වූ අය සිටිනවාද?එයින් බේරෙන්න බැරිවුන අය සිටිනවාද? යන්න
④ ඔබගේ නම සහ දුරකථන අංකය



## （3） මහාමාර්ග රිය අනතුරක් ඇතිවුන අවස්ථාවේදී

「 110 」 අංකයට අමතන්න. <u>පොලිස් නිළධාරීන් ( *Keisatsukan* )</u> පැමිණේ.
දුරකතනයෙන් පහත සඳහන් ආකාරයට සඳහන් කරන්න.

① 「රිය අනතුරක් ඇතිවුණා 」
② කවදා රියඅනතුර සිදුවූවාද? යන්න
③ කොහේදී රියඅනතුර සිදුවූවාද? යන්න
④ තුවාල වී සිටින අය ඉන්නවාද?
⑤ ඔබගේ නම සහ දුරකථන අංක





◎ 5 වෙනි පිටුවේ අමාරු වචන ◎
※ඇම්බියුලන්ස් එක ( *Kyūkyūsha* ) : තුවාල වූ අය සහ අසනීප වූවන් රෝහලට ගෙනයන වාහනය
※ගිණි නිවන වාහනය ( *Shōbōsha* ) : ගින්නක් ඇතිවූවිට ගින්දර නිවන වාහනය
※පොලිස් නිළධාරීන්( *Keisatsukan* ) : පොලිස්කාරයෝ ( *Keikan* )